# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்


**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


උතුරු පළාත් සභා ඡන්ද විමසීම 2013

**මාධ්‍ය නිවේදනය - අංක 04**

**උතුරු පළාතේ, යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය, චාවකච්චේරි මැතිවරණ කොට්ඨාශයේ මිරිසුවිල් දුර්ගෙයි අම්මාන් කෝවිල අසල ප්‍රදේශය.**

චාවකච්චේරි නගර සභාවේ සභික අරුනාචලම් බාලකුමාරන් මහතා වාර්තා කළ පරිදි ඉහත සඳහන් කෝවිල අසල ප්‍රදේශයේ එ.ජ.නි.ස ආධාරකරුවන් 25-30 ක් අතර ප්‍රමාණයක් ප්‍රචාරක පත්‍රිකා බෙදමින් සිට ඇත. මෙකී පිරිස හමුදාවට සම්බන්ධ පිරිස් බවට අරුනාචලම් මහතා චෝදනා කරනු ලැබූ අතර හමුදා නිල ඇඳුම් ඇඳගත් නිළධාරීන් දෙදෙනෙක් ද මෙකී පිරිසට ආරක්ෂාව සපයමින් සිට ඇත.

ප.ව 2.00 ට පමණ මැ.ප්‍ර.නි.ම. අමතමින් අරුනාචලම් මහතා පැවසුවේ හමුදා සාමාජිකයින් විසින් තමන් අදාළ ස්ථානයේ සිටියදී පළවා හරින ලද බවයි. තවදුරටත් ඔහු පැවසුවේ තමන් සමඟ දෙ.ජා.ස. මැතිවරණ ව්‍යාපාරයේ නිරතව සිටි පිරිස ද එලෙස පලවා හරින ලද බවයි. ඔහු තවදුරටත් මැ.ප්‍ර.නි.ම. වෙත පැවසුයේ මරදන්කුලම් පිල්ලෙයි කෝවිල අසල ප්‍රදේශයේදී එම සිද්ධිය හටගත් අවස්ථාවේදී කොඩිකාමම් පොලිසියේ ස්ථානාධිපති එදිරිසිංහ මහතාද අදාළ ස්ථානයට පැමිණි බවයි.

මැ.ප්‍ර.නි.ම කොඩිකාමම් පොලිසිය ඇමතූ අවස්ථාවේදි ඉන් කියැවුයේ ජංගම පොලිස් රථයක් පොලිස් ස්ථානාධිපතිවරයා ද ඇතුළත්ව අදාළ ප්‍රදේශය කරා පිටත් වී ඇති බවයි. එහිදි පොලිස් ස්ථානාධිපතිවරයා දුරකතනය හරහා සම්බන්ධකර ගත්ත ද ඔහු පසුව අමතන ලෙස දැන්වීය. ප.ව. 4.30ට පමණ ඔහු සම්බන්ධ කරගත් මොහොතේදී පැවසුවේ මරදන්කුලම් පිල්ලෙයි කෝවිල අසල ඉතා සුළු සිද්ධියක් වාර්තා වුවත් ඊට අදාළ විධිමත් පැමිණිල්ලක් ලැබී නොමැති බැවින් ඊට අදාළ තොරතුරු ප්‍රකාශ කල නොහැකි බවයි. ඔහු තවදුරටත් පැවසුයේ අදාළ පුද්ගලයන්ට පොලිසියට පැමිණ පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බවයි.

එමෙන්ම හමුදා නිළධාරීන් මෙකී සිද්ධියට සම්බන්ධ නැති බවද ඔහු ප්‍රකාශ කළේය. වැඩිදුරටත් කරුණු විමසීම සඳහා අරුනාචලම් මහතා සම්බන්ධකර ගැනීමට මැ.ප්‍ර.නි.ම උත්සාහ කළද එය අසාර්ථක විය.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |